මතට තිතද? තිතට මතද?

''බිගෙන එන හින්දා
අප්පච්චි හැමදාමත්
අම්ම ගියා තරහවෙලා
කොකියා අප කාටත්''

මීට වසර තිහකට පමණ පෙර චන්ද්‍රා අනගිරත්න සූරීන් ඉරිදා පුවත්පතකට ලියන ලද ''පැංචාගේ අදෝනාව'' නම් වූ කවි පෙළක පද දෙකකි ඒ. අම්මා සමග තරහවෙලා ගිය අප්පුච්චා ආපසු ගෙදර එන්නට ඇත. එහෙත් පසුගිය සතියේ අධික බීමත්කම නිසා උගත් තරුණ බිරිඳක් වස පානයකොට මියගියේ කුස තුළ සිටි දරු පැටියා-ද විනාශ කර ගනිමිනි. අධික බීමත්කමේ ආදීනව වටහා ගත් තරුණ සැමියාද ගෙල වැළලාගෙන මිය ගියේය. මේ වාර්තා වූ එක් සිද්ධියක් පමණි. මේ තැනැත්තා බීමට ඇබ්බැහි වූයේ ඔහුගේ නිවෙස අසළ තිබූ බීම සාප්පුවක් නිසා යැයි පෙන්වාදෙන්නට කිපදෙනෙක් උත්සාහ කළහ. එහෙත් එතැන බීම සාප්පුවක් නොතිබුණත් ඔහු එක්කෝ කසිප්පු බොහු ඇත. නැත්නම් සැතපුමක් පමණ ඈතින් පිහිටි වෙනත් බීම සාප්පුවකින් බෝතලයක් ගෙනෙනු ඇත.

මත්පැන් පානය අඩු-වැඩි වශයෙන් මිනිසුන් භාවිතයට පුරුදු වූයේ අනාදිමත් කාලයක සිටය. තථාගතයන්වහන්සේ සමග දානයකට වැඩි භික්ෂුවක් අධිකව මත්පැන් පානය කොට රෝගී වූ අවස්ථාවේ එම භික්ෂුව මීට පෙර ආත්ම භවයකදීත් එසේ මත්පැන් පානය කොට වෙරිවි රෝගාතුර වූ කෙනෙකු වූ බව ජාතක කතාවක සඳහන් වේ.

ප්‍රවීණ මාධ්‍යවේදී
ඇස්. පියසේන

දුටුගැමුණු රජතුමාගේ නිමල නමැති සෙන්පතියාට ''සුරන-ිමල'' යන නම පටබැඳුනේ සුරාවට ඇබ්බැහිවීම නිසා බව පත පොතෙහි සඳහන්වේ.
මත්පැන්හල් පිළිබඳ දෙස් විදෙස් සිද්ධීන් ගෙනහැර පෑමට පෙර අපි අපේ රටේම අමධ්‍යප ව්‍යාපාරයේ ඉතිහාසය දෙස හැරී බලමු.

අපේ ජනකතාවල පමණක් නොව අපට මතක වසර 75කට පෙර කාලයේදීද මත්පැනට රුචිවූ බහුතරය පානය කළේ පොල්, කිතුල් හා තල් වැනි මල්වලින් පෙරාගන්නා ලද රා ය.

පෙරූ මත්පැන් අපේ සමාජයට හඳුන්වාදෙන ලද්දේ යටත් පිපිත යුගයේදී බව පැහැදිලිය. ඉංග්‍රීසින් සිංහලේ අන්තිම රජුට මත්පැන් පුරුදු කරවා ඔහු ළවා කරවන ලද අපරාධ ඉතිහාසයේ පෙන්නුම් කරයි.

බොහෝ දුරට විසිවන ශතවර්ෂය මුලදී අපේ අමධ්‍යප ව්‍යාපාරය සමත්වූයේ මේ ''සුර මත්පැන්වලින්'' ජනතාව බේරාගැනීමට බව පැහැදිලිය. මත්පැන් වෙළඳාමෙන් යටත් පිපිත රජයට ලැබෙන විශාල ''මේන්ද'' ආදායම නැතිවන නිසා ඔවුහු අමධ්‍යප ව්‍යාපාරය තරමක් දුරට මර්ධනය කිරීමේ ක්‍රියාදාමයන් දියත් කළ බව පැහැදිලිය. 1915 මාර්ශල් ලෝ නීතිය යටතේ සිරභාරයට ගන්නා ලද බහුතරය මුස්ලිම් ආගමිකයන්ට විරුද්ධව ගිංසා විසා කළ අය නොවේ. එසේ සිරභාරයට ගන්නා ලද්දේ ඩී.බී. ජයතිලක, එෆ්.ආර්. සේනානායක, පියදාස සිරිසේන හා බොරළුගොඩ රාලහාමි වැනි අමධ්‍යප ව්‍යාපාරයේ ප්‍රහුන්ය.

පෙරන ලද මත්පැන්හල් විශාල වශයෙන් ව්‍යාප්ත වන්නට පටන් ගත්තේ 1980 දශකයේ සිටය.

එබඳු මත්පැන් බලපත්‍ර ලබාගැනීමේදී දේශපාලනයද ක්‍රියාත්මක වන බව රහසක් නොවේ. මන්ත්‍රීවරයන්ට අයිති බීම හල් ගැනද අසන්නට ලැබේ. මීට වසර 25කට පෙර කොළඹ නගරයේ නාගරික මන්ත්‍රීවරයකුට මාවනැල්ල ප්‍රදේශයේ මත්පැන්හලකට බලපත්‍රයක් ලැබුණු බව ඒ කාලයේ වාර්තා විය.

කෙසේ වුවද මත්පැන්හල් පැතිරි තරමටම හෝ ඒවා එක් ප්‍රදේශයක තහනම් කළ පමණින් හෝ බීමත්කම දුරකළ හැකිද?

1997 සිට 87 දක්වා හෝමාගම පාර්ලිමේන්තු කොට්ඨාශය නියෝජනය කළ ගාමිණී ජයසූරිය මහතා තම ඡන්දදායක කොට්ඨාශය තුළ මත්පැන්හල් සහ ගවමස් කඩද ඇරඹීමට අනුබල දුන්නේ නැත. එහෙත් අරක්කු බීමට හෝ ගවමස් කෑමට අවශ්‍ය මිනිහා අතේ දුරින් පිහිටි මහරගම කොට්ඨාශයට අයත් කොට්ටාවට හෝ කඩුවෙල ඡන්ද කොට්ඨාශයට අයත් අතුරුගිරියට හෝ ගොස් අවශ්‍යතා පිරිමසා ගනියි.

විදේශයන්ට හැරෙමු. 1980 දශකයේ කුවේට් දේශය ආගමික හේතුන් මත මත්පැන් තහනම් කළේය. එහෙත් ඒ රටේ ''බීමට ගිලු'' ධනවතුනු සැතපුම් 60ක් ඈතින් පිහිටි ඉරාකයේ බැග්ඩෑඩ් නුවරට ගොස් හොඳට ''සප්පායම්'' වූහ.

අතුරු කතාවක් සඳහන් කළ යුතුය. කලක් තමිල්නාඩු ප්‍රාන්තය ''අමධ්‍යප ප්‍රාන්තයක්'' විය. මත්පැන් තිතුත්කරන ලද්දේ වෛද්‍ය උපදෙස් මත හා සංචාරකයන්ට පමණි. මෙයින් ප්‍රයෝජන ගත් ඇතැම් ශ්‍රීලාංකික ''කුට'' වන්දනා ගමන් සංවිධායකයන් ගැහුණු, පිරමිඩ, ඇතැම්විට පැවිදි'' අයගෙන් අස්සන් ලබාගෙන බලපත්‍රය බීමහලටම විකුණා මුදල් ලබාගත් බවටද පැමිණිලි ලැබුණි. මේ ගැන මහකොමසාරිස් කාර්යාලය මැදිහත්වීමෙන් එම ජාවාරම නැවතිණ.

ගම්බඳ ජනතාව වැඩිපුරම (මීට වසර පනහකට පෙරා) බීමට ගත්තේ මුලින් කිවාක් මෙන් මල්වලින් පෙරාගන්නා රා ය. මේවා ''සැර'' මදිකම නිසා ඇතැම් ''බේබද්දෝ'' කසිප්පු පානයට පුරුදු වූහ. මේ භයානක උවදුර වටහාගත් ආචාර්ය එන්.එම්. පෙරේරා ගැමියන්ට පොල් ගස් දෙකක් හෝ කිතුල් ගසක් රා මැදීමට යොදාගැනීමට නිදහස් කර දිය යුතු යැයි යෝජනාවක් ඉදිරිපත් කළේය. කොළඹ පැවැති එක් රැස්වීමකදී ඒ මහතා කළ ප්‍රකාශයක් ඉතා වැදගත්ය. ඒ මෙසේය.

''මගේ කොට්ඨාශයේ කිතුල්ගල ගමේ මිනිස්සු ටික කාලෙකට ඉස්සරත් බීවේවි කිතුල් රා. නමුත් දැන් කසිප්පු වසංගතය ඒ පළාත්වලටත් බෝවෙන්න පටන් අරන්.''

ආචාර්ය පෙරේරාගේ මේ යෝජනාව ''අකුළාගන්නට'' සිදුවූයේ ''පෙර රා'' යන අන්වර්ථ නාමයක් ලබාගනිමිනි.
මේ සියල්ලන් ඔප්පු වන්නේ බීමත්කම දුරුකිරීමට නම් සමාජය යහමගට යොමු කිරීම අත්‍යවශ්‍ය බවය. දීර්ඝ කාලයක් තිස්සේ ''කෑමට පෙර හිත සැහැල්ලු කරගැනීම සඳහා'' යැයි කියමින් ''ගින් අඩියක්'' ගන්නට පුරුදු වූ ඉහළ සමාජයේ පුද්ගලයන්ගේ හෝ හැන්දෑ ජාමයේ ගොවිපොළේ වැඩ නිමවි ''ඒ කාලේ'' රා පොළෙන් ලුණු කැටයක් හපමින් රා පොල්කටු දෙකක් බීවි ගැමියන්ගේ හෝ සමාජයට එතරම් කරදරයක් නොවූ බව අත්දැකීමෙන් අපි දනිමු.

එහෙත්? කසිප්පු හා ඊටත් වඩා ''ඉදිරියට ගිය'' හෙරොයින්වලින් වන විනාශය?

සිසිර දිසානායක

කර දිය ගැඹරේ - ලා ලල ලා
ලා
හම් හම් ..... - හා හහ හා
හා
සුනුඹුල් අත් පා - ය දඬු
කරන්නයි
කිරි කැටි පුතුනේ.....

උදේ පාන්දර නාන කාමරේ ඇතුලෙන් අපූරු සිංදුවක හඬක් ! වතුර මලෙන් වැටෙන වතුර සද්දේ අතරින් ඒ ඇහුනෙ පැන්සලගෙ කට හඬ

"රියේ මෝ එකනම් හොඳට තිබුණා නේද ?" පැන්ගේ සින්දුව ඇහිලා පින්සල පන්හිඳගෙන්

"ආරාධනා"

ඇහුවා. කට්ටියම කලින් දා රෑ තිබුණ "රස මධුර" ගීත ප්‍රසංගයට ගිහින් ඇවිත් නිදාගත්තේ බොහෝම රෑ වෙලා.

"රියේ මෝ එකනම් හොඳට තිබුණා නේද ?" පැන්ගේ සින්දුව ඇහිලා පින්සල පන්හිඳගෙන් ඇහුවා. කට්ටියම කලින් දා රෑ තිබුණ "රස මධුර" ගීත ප්‍රසංගයට ගිහින් ඇවිත් නිදාගත්තේ බොහොම රෑ වෙලා.

"ටී.එම් ජයරත්න මහත්තයයි, එඩ්වඩ් ජයකොඩි මහත්තයයි ඉස්සර වගේම යසට ගායනා කළා. රෝහිණ විරසිංහ මහත්තයත් ඒ අයගෙ හොඳම සින්දු ටික තෝරගෙන තිබුණා ප්‍රසංගයට" පන්හිඳ තමුන්ට දැණුන දේ කිව්වා.

"වාදනය කරන්නත් හොඳම කට්ටියක්නේ තෝරාගෙන තිබුණේ. තබ්ලාවට ධනංජය සෝමසිරි, වයලින් එකට ඩී.ඩී. ගුණසේන බටහලාවට ජානක, සර පුවරුවලට ඉන්ද්‍රජිත් මිරිහාන, තාල වාද්‍ය කට්ටලයට ජූඩ් ප්‍රනාන්දු, ගිටාර් වලට මහේන්දු පසස්කුවෙල් වගේ මහත්තුරු එකතු වුණාට කියන්න දෙයක් නෑ ඉතින්.

"ඇයි අපේ කැමරන් කොළඹගේ, මහත්තයාගේ ගිටාර් එක ? නවීන් ගුලවිට දරුවගේ වයලින් එක ? ඒවාත් අරවාට දෙවෙනි වුණේ නෑ. ඒ වගේම ශබ්ද පරිපාලනයනම් මේ පාර අගෙයි. හරියට සංගත තැටියක සින්දු අහනවා වගෙයි දැණුනේ. ඉන්ද්‍රජිත් මිරිහාන මහත්තයාට ස්තූති කරන්න ඕන ඒ වැඩේට."
"රුක්මාල් නිරෝෂ් ගේ ආලෝකකරණයයි, සංජීවගේ ඉදිරිපත් කිරීමයි ගැහත් මතක් කරන්න ඕන..."

"මං මේ පාර "ආරාධනා" ගායනා කවයේ වැඩේට එඩ්වි ජයකොඩි මහත්තයාගේ.... "කරදිය ගැඹරේ" කියන්නයි හිතාගෙන ඉන්නේ....." පැන්සල නාන කාමරයෙන් එළියට ආවා.

"කියනවනම් අපටත් දැන් ඩිංගකට ඉස්සෙල්ලා ඇහුණා... හැබැයි ඉතින් ගායනා කරන්න ගිතාගෙන ඉන්නවානම් තවටිකක් එකයි දෙක-ක්නෙ..." පන් පණ්ඩිත වාක්‍යයක් කිව්වා.

"ඒකනම් ඉතින් ඇත්ත තමා. ඒත් ඉතින් ගායනා කරන්නෙ ගායකයොනෙ. අපට ඉතින් කොහෙන්ද ඒ තරං පුළුවන් කමක් ? ඒ හංදා ටිකක් ඔහේ සංතෝස වෙන්න සිංදුවක් දෙකක් කියාගන්න පුළුවන් වුණොත් ඇති. අනික ඉතින් අපට මේ නහින දෙහින කාලේ ගායකයො වෙන්නත් උණාක් නෑ ඇත්තටම...."

"සන්තෝසෙට ඔය යාලුවො එකතුවෙලා තමං ආස කරන සින්දු කියන එක ඇත්තට ම හොඳයි තමයි. අපේ අය පොඩ්ඩක් මොනවා හරි තොල කට ගා ගත්තම කරන්නේ එක්කෝ දේශපාලනේ අල්ලාගෙන ලංකාවටම බණින එක. නැත්නං ආගම අල්ලගෙන පන්සල්වලට, දොස් කියන එක. ඊට වඩා නම් දාහෙන් සම්පතයි සින්දුවක් කියලා සංතෝස වෙලා ලේ පිරිසිදු කරගන්න එක." ඒ පින්සල.

"ඒ අතින් ලලිත්ගේ අදහසනං පංකාදුයි..... !" "ආරාධනා" ගායන කවය ගැන යමක් ලියන්න ඕන කියලා පන් හිතුවා.

"ආරාධනා" සංගීත කවය මෙල්බර්න් ගායක ලලිත් අරුණශාන්ත මහත්මාගේ අදහසයි. ඉන්දියානු සම්භවයක් ඇති මෙ'පුර වාසීන් අතර ඇති මෙවන් කවවල හින්දි ගී ගැයුමට ඇරයුම් ලද ලලිත්ගේ සිතට ආ සිතුවිල්ලක් අනුව අප හට ගැලපෙන සේ "ආරාධනා" සංගීත කවය නිර්මාණය විණ. මේ සඳහා රාජා සහ ලලිතා යුවලගේ නිවසේදී පැවැත්වුණ මුල්ම හමුවට අපි ද ඇරයුම් ලැබුවෙමු. නන්ද තිලකරත්න, නන්දන ඇතුලත්මුදලි, පොලි විරක්කොඩි දෙපළ, නිමල් ඒකනායක යුවල, ඩඩ්ලි හා ලලිතා විමලතිස්ස යුවල, රෝගිත වැල්මිල්ලගේ, අතුල ලෙව්කේ බණ්ඩාර, ජයන්ත සමරක්කොඩි, ආනන්ද සහ චාන්දනී සිරිවර්ධන යුවල වැනි අයගේ සහභාගිත්වයෙන් මෙම සද් කාර්යය සඳහා මූලික සාකච්ඡාව පැවැත්විණ. පොලි විරක්කොඩි මහත්මා විසින් "ආරාධනා" යන නම යෝජනා කරන ලදී. මූලික සාකච්ඡාවලින් අනතුරුව

පැවැත්වුණ සාජ්ජය "ආරාධනා" මියැසි කවයේ මුල්ම හමුවක් ලෙස සිතිය හැකියි.

ගන්නා ලද තීරණයන්ට අනුව "ආරාධනා" මියැසි කවය ප්‍රසංගයකට වඩා ගී ගැයුමට කැමති ගී ගීතකාමීන්ගේ හමුවක් ලෙසින් හඳුන්වා දිය හැකියි. එවන් ගායනයට ලැදියවුන් හට පැමිණ ගී ගැයීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම මෙහි මූලික අරමුණයි. අපේක්ෂිත පිරිසට සැහෙන කුඩා ශාලාවක් කුලියට ගැනීම සඳහාත් සංග්‍රහ කටයුතු සඳහාත් අවශ්‍ය මුදල් පියවා ගැනීම සඳහා ක්‍රමවේදයක් සිතිය යුතු විය. ප්‍රවේශ පත්‍ර අලෙවි කිරීමකින් තොරව කැමති අයහ ට කැමති මුදලක් පරිත්‍යාග කිරීම සඳහා " ආධාර" පෙට්ටියක් තැබීමටත් පොදුවේ ඉල්ලීමක් කිරීමත් වඩාත් සුදුසු යැයි තීරණය විය. ගායනය කිරීමට බලාපොරොත්තුවන එක් අයකුගෙන් දළ වශයෙන් ඩොලර් පහක් පමණ පරිත්‍යාග වශයෙන් ලැබෙනු ඇතැයි අනුමාන කෙරිණ. කැමති අය හට තේ කෝපි බීම සඳහා බිස්කට්, කේක වැනි දේ හෝ සරළ ආහාර වර්ග ගෙන ඒමට හැකි බවටද යෝජනා විය.

මූලයමය ගැටලුවලට අමතරව කාලය පිළිබඳව ද සිතීමට සිදු විය. එක් අයෙකුට ගීත දෙකක් ගැයීමට ඉඩ කඩ සළසා දීමටත්, ඒ ඒ දිනවලදී ගායනය සඳහා පැමිණෙන පිරිස අනුව ගීත ප්‍රමාණය අඩු - වැඩි කිරීමටත් තීරණය විය. මූලිකව සෑම මසකම තුන්වන සතියේ සෙනසුරාදා රාත්‍රී හතේ සිට ගායන කවය පවැත්වීමට යෝජනා වූ අතර, ඉල්ලුම අනුව මෙල්බර්න් නගරයේ නැගෙනහිර හා බටහිර මෙවැනි කව දෙකක් පැවැත්වීම පිළිබඳව ද සළකා බැලින.

ගායනාවන් සඳහා සංගීතයෙන් දායකවන්නේ කවුරුන්ද යන්න ඊළඟට සිතා බැලිය යුතු විය. ස්ටේජ්ජාවෙන් ඉදිරිපත් වූ පිරිස අතර සර පුවරුව වැයීම සඳහා අතුල ලෙව්කේබණ්ඩාර ගිටාරය සඳහා රෝහිත වැල්මිල්ලගේ, තබ්ලාව සඳහා අනන්ද සිරිවර්ධන වැනි සහෘදයන් පිරිසක්

20 වන පිටට